ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>ඉන්දීය නාවික හමුදාවේ INS තරංගිනි රුවල් පුහුණු නෞකාව ශ්‍රී ලංකාවට පැමිණේ</u>**

'මිත්‍රත්වයේ පාලම්' ගොඩනැගීම සඳහා ඉන්දීය නාවික හමුදාව ගන්නා ප්‍රයත්නය අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් INS තරංගිනි රුවල් පුහුණු නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදාවේ පුහුණු වන නිලධාරීන් සඳහා වරාය අදියරේදී මෙන්ම මුහුදු අදියරේදී ද සාගරයේ යාත්‍රා කිරීම සම්බන්ධයෙන් පුහුණුව සහ අත්දැකීම් ලබා දීම සඳහා 2026 පෙබරවාරි 27 සිට මාර්තු 2 වන දින දක්වා ත්‍රිකුණාමලයේ ද 2026 මාර්තු 06 සිට 09 දක්වා කොළඹ ද සංචාරයක නිරත වේ. කොමාන්ඩර් නිතින් ගජ්ජර් නෞකාවේ අණදෙන නිලධාරියා ලෙස කටයුතු කරනු ලබයි. මෙම නෞකාව ජාත්‍යන්තර යුධ නෞකා දැක්ම 2026 සඳහා සහභාගී වීමෙන් අනතුරුව විශාඛාපට්නම් හි සිට ආපසු යාත්‍රා කරන අතරතුර ශ්‍රී ලංකාවට පැමිණේ.

2. ඉන්දියානු නාවික හමුදාව මෙම එංජින් සහ ගෑස් ටර්බයින යුගයේ රුවල් පුහුණු නෞකා මෙහෙයවන නාවික හමුදා කිහිපය අතරින් එකකි. INS තරංගිනි නෞකාව ලෝ ප්‍රකට රුවල් නෞකා නිර්මාණ ශිල්පී කොලින් මුඩි මහතා විසින් නිර්මාණය කර ඇති අතර ගෝවා ෂිප්යාඩ් ලිමිටඩ් හිදී දේශීයව නිෂ්පාදනය කර ඇත. ඉහළ දරා ගැනීමේ හැකියාවක් සහිත බඳක් සහිත නෞකාව ඇලුමිනියම් තට්ටුවකින් මෙන්ම මතරම් තේක්ක දැවයෙන් ද සමන්විත වේ. රුවල් නෞකාවේ සමස්ත දිග මීටර 54ක් පමණ වන අතර බර ටොන් 500ක් පමණ වේ. රුවල් 20කින් සමන්විත වන නෞකාවේ සමස්ත රුවල් වපසරිය වර්ග අඩි 10,000කට අධික ය. කඹ 200කින් සමන්විත නෞකාවේ සමස්ත කඹවල දිග කිලෝ මීටර 20කට අධිකය.

3. කුඹ ගස් තුනකින් සමන්විත මෙම නෞකාව ඉන්දීය නාවික හමුදාවේ ප්‍රථම රුවල් පුහුණු නෞකාව වේ. කොච් හි පලමු පුහුණු බලඇණියට අයත් වන නෞකාවේ ප්‍රධාන භූමිකාව වන්නේ ඉන්දීය නාවික හමුදාවේ සහ වෙරළාරක්ෂක බලකායේ පුහුණු වන නිලධාරීන් සඳහා රුවල් පුහුණුව ලබා දීමයි. නෞකාවේ කාර්ය මණ්ඩලය නිලධාරීන් 7 දෙනෙකුගෙන් සහ යාත්‍රිකයන් 30 දෙනෙකුගෙන් සමන්විත වන අතර එක් වරකට කැඩෙට් නිලධාරීන් 30 දෙනෙකු නෞකාවට යෙදවිය හැකිය.

4. 'තරංගිනි' යන නම රළ හෙවත් තරංගය යන අදහස දෙන 'තරංග්' යන හින්දි වචනය ඇසුරින් සැදී ඇත. ඒ අනුව 'තරංගිනි' යන්නෙහි තේරුම 'රළ මත යාත්‍රා කරන්නී' යන්නයි. ලොව වටා යාත්‍රා කළ ඉන්දිය නාවික හමුදාවේ ප්‍රථම නෞකාව වීමේ සුවිශේෂී ගෞරවය ද 'තරංගිනි' නෞකාව සතු වේ. 2004 වර්ෂයේ නාවික සැතපුම් 35,000ක් ආවරණය කරමින් වරාය 37ක සහ රටවල් 18ක සංචාරය කරමින් මෙම ජයග්‍රහණය අත් කර ගන්නා ලදී. ඉන්දියාවේ පොහොසත් සමුද්‍රීය උරුමය සහ සාගර යාත්‍රා හැකියාවන් පෙන්නුම් කරමින් 2008 වසරේදී නෞකාව පුරාණ ඉන්දිය නාවිකයන්ගේ ගිණිකොණ දිග ආසියානු (ජකර්තා, සිංගප්පූරුව, පූකට්) නාවික ගමන් මග ඔස්සේ නැවතත් යාත්‍රා කළේය. තරංගිනි නෞකාව මිත්‍රශීලී ජාත්‍යන්තර චාරිකා (ලෝකායන් චාරිකා) පහක් හරහා මෙන්ම ඇමරිකාවේ සහ යුරෝපයේ රුවල් යාත්‍රා තරඟ ජයග්‍රහණ සහ විශාඛාපට්නම් හි පැවති ජාත්‍යන්තර යුධ නෞකා දැක්ම 2026 ඇතුළු ජාතන්තර යුධ නෞකා දැක්මන් සඳහා සහභාගී වීම හරහා ඉන්දිය නාවික හමුදාවේ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රයත්නයන් සඳහා ද සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත.

5. ත්‍රිකුණාමල සංචාරය අතරතුරදී නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරීන් තිදෙනෙකුට සහ පුහුණු වන නිලධාරීන් 25 දෙනෙකුට සාගර යාත්‍රා පුහුණුව ලබා දෙනු ඇත. අති නවීන තාක්ෂණය සහ ස්වයංක්‍රියකරණයෙන් සපිරි අද යුගයේ පවා රුවල් පුහුණු නෞකාවක් මුහුදු යාත්‍රාකරණයේ මූලිකාංග ඉගෙන ගැනීමට මනා අවස්ථාවක් වන අතර ඒ තුළින් මුහුද සහ සුළඟ පිළිබඳ වැදගත් කරුණු කාරණා මෙන්ම නාවික ජීවිතය හා බැඳී පවතින ධෛර්යය, සහෝදරත්වය සහ දරා ගැනීම යනාදිය ප්‍රගුණ කිරීමට ද අවස්ථාව හිමි වේ. ඉන්දිය නාවික හමුදාව විසින් ලබා දෙන මුහුදේ යාත්‍රා කිරීමේ අත්දැකීම මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවේ උනන්දුව වඩාත් වර්ධනය කරනු ඇත.

****

*කොළඹ*
*2025 පෙබරවාරි 25*